# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
## அரச கணக்குகள் திணைக்களம்
## Department of State Accounts

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. SA/GFS/01/01/08 – Volume ii | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2021.07.26 |

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**රජයේ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම් ගිණුම්ගත කිරීම සහ සැසඳීම**

රජයේ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමේ වැඩසටහන යටතේ දැනටමත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විශාල ප්‍රමාණයක් එම වැඩසටහනට අනුගත වී ඇති නමුත් මෙතෙක් එම වැඩසටහනට විධිමත්ව අනුගත නොවූ ආයතනද ඇත. රජයේ අවසාන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙම මූල්‍ය නොවන වත්කම්වල අගයන් පෙන්නුම් කරන බැවින් නිවැරදි ආකාරයට එම තොරතුරු පවත්වා ගැනීම සඳහා සෑම රජයේ ආයතනයක්ම ප්‍රමුඛතාවය ලබා දිය යුතු අතර ගිණුම්මය නිවැරදිතාවය පවත්වා ගැනීමද ආදාළ ආයතනය සතු වගකීමකි. ගිණුම්වල නිවැරදි අගයන් පවත්වා නොගැනීම තුළින් අවසාන ගිණුම්වල පෙන්නුම් කරනු ලබන වටිනාකම් පිළිබඳව විගණකාධිපති විසින් විමසීම් කර ඇත. එම නිසා මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම් නිවැරදිව පවත්වා ගෙන යාම සඳහා පහත සඳහන් උපදෙස් අනුගමනය කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

02. මූල්‍ය නොවන වත්කම්හි ගිණුම්මය නිවැරදිතාවය පවත්වා ගැනීම සඳහා ඔබ ආයතනයේ (අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු) පොත් ශේෂයන්, සෑම විටම භාණ්ඩාගාර මුද්‍රිත සටහන්හි ශේෂයන් (වත්කම් ලෙජර් ශේෂයන්) සමඟ ද CIGAS web interface හරහා උඩුගත කරනු ලබන කේවල වත්කම් ශේෂයන් (වත්කම් වාර්තාවෙහි ශේෂයන්) සමඟ ද සමාන විය යුතු වේ. මේ සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිරන්තර උපදෙස් ලබා දී ඇති අතර 2021.02.02 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 1හි දක්වා ඇති පරිදි New CIGAS වැඩසටහනට එදිනෙදා ඇතුළත් කරන දත්ත දිනපතා පරීක්ෂා කර නිවැරදි තොරතුරු පමණක් එවීමට වග බලා ගත යුතු වේ.

03. ඒ අනුව, CIGAS වැඩසටහනෙහි වත්කම් ගිණුම්ගත කිරීමේදී වත්කම් ලෙජර් ලැයිස්තුවේ (Asset Ledger - භාණ්ඩාගාර මුද්‍රිත සටහන්) ශේෂය හා වත්කම් වාර්තාවෙහි (Asset Report - CIGAS web interface වෙතින් උඩුගතකර ඇති කේවල වත්කම්) දක්වා ඇති ශේෂයන් එකිනෙකට සමාන විය යුතු නමුත් බොහෝ ආයතනවල මෙම ශේෂ අතර පරස්පරතාවන් පවතින බව CIGAS වැඩසටහනෙහි ගිණුම්ගත කරන ලද තොරතුරු පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය.

මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව. பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General - Tel.: +94 11 2484500/600 Ext.: 1149 Fax : +94 11 2484869 Website : www.sad.gov.lk
Director General - Tel.: +94 11 2484728 Fax : +94 11 2473856 e -mail : dgsa@sad.treasury.gov.lk

04. එබැවින්, ඔබ ශීර්ෂය යටතේ එන CIGAS වැඩසටහනෙහි වත්කම් ලෙජර් ලැයිස්තුවේ (භාණ්ඩාගාර මුද්‍රිත සටහන්හි) හා වත්කම් වාර්තාවෙහි (CIGAS web interface වෙත උඩුගතකර ඇති තොරතුරු) ශේෂ පරීක්ෂා කර බලා 2021.07.31 දිනට සැසඳීම් කර මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රය ප්‍රකාරව gfs.sad.treasury@gmail.com යන විද්‍යුත් ලිපිනය හරහා මෙම දෙපාර්තමේන්තුව වෙත 2021.08.15 දිනට පෙර වාර්තා කරන ලෙස කාරුණික ඉල්ලා සිටිමි..

එම ආකෘති පත්‍රය පහත ආකාරයෙන් බාගත කර ගත හැකිය.

www.treasury.gov.lk ➡ About us ➡ Departments ➡ Department of State Accounts ➡ Links ➡ Download Formats ➡ Reconciliation of Non-financial Asset Balances in CIGAS as at 31st July 2021

05. මින් ඉදිරියට ඔබ ආයතනයේ ගිණුම්ගත කර ඇති වත්කම් වටිනාකම් පිළිබඳව මනාව පරීක්ෂා කර බලන ලෙසත්, එම වටිනාකම් මාසික ගිණුම් සාරාංශ එවීමට පෙර මාසිකව සැසඳීම් කර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කරන ලෙසත්, එහිදී යම් තාක්ෂණික සහයෝගයක් අවශ්‍ය වන්නේ නම් මෙම දෙපාර්තමේන්තුවේ පද්ධති සංවර්ධන හා පුහුණු අංශයේ අධ්‍යක්ෂ (දු.අ. 011-2484826) සම්බන්ධ කර ගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

06. තවද, තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර වාර්තා කර ඇති ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් නිවැරදිව CIGAS වැඩසටහන හරහා ගිණුම්ගත කරන ලෙසත්, තක්සේරු කර ඇති ඉඩම් හා ගොඩනැගිලිවලට අමතරව තවදුරටත් ඔබ ආයතනයට අයත් තක්සේරු කළ යුතු ඉඩම් හා ගොඩනැගිලි පවතී නම් ඒවාද තක්සේරු දෙපාර්තමේන්තුව ලවා තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් ඉල්ලා සිටිමි.

07. එමෙන්ම, රජයේ ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කිරීමේ කාර්යය සඳහා මේ දක්වා ඔබ ආයතනය වෙතින් ලද නොමඳ සහයෝගයට කෘතඥතාව පළ කර සිටින අතර රජයේ මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම ප්‍රමුඛ කාර්යයක් සේ සළකා අවශ්‍ය කටයුතු කඩිනමින් ඉටු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

ඩබ්.ජේ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත : විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය

**CIGAS වැඩසටහනෙහි මූල්‍ය නොවන වත්කම් වටිනාකම් සැසඳීම (2021.07.31 දිනට)**
(Reconciliation of Non-financial Asset Balances in CIGAS at 31st July 2021)

ශීර්ෂ අංකය :
(Head No.)

ආයතනයේ නම :
(Name of the Institute)

| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|---|
| වත්කම් කේතය | විස්තරය | දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය (රු.) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව ශේෂය (වත්කම් ලෙජරය) (රු.) | **CIGAS web interface වෙතින් උඩුගතකර ඇති කේවල වත්කම් ශේෂය (වත්කම් වාර්තාව) (රු.)** | තීරු අංක 1 හා 2 අතර වෙනස | තීරු අංක 1 හා 3 අතර වෙනස | තීරු අංක 2 හා 3 අතර වෙනස | වෙනසක් පවතී නම් ඊට හේතු | වෙනස නිවැරදි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග |
| Asset Code | Description | Balance according to the Department's books (Rs.) | Balance according to the Treasury prinouts (Asset Ledge} (Rs.) | Individual Balance uploaded through CIGAS web interface (Asset Report-BOS) (Rs.) | Difference between column 1 & 2 | Difference between column 1 & 3 | Difference between column 2 & 3 | Reasons for Difference | taken actions for correct differences |
| 9151 | ගොඩනැගිලි හා ඉදිකිරීම් (Buildings & Structures) | | | | | | | * | * |
| 9152 | යන්ත්‍රසූත්‍ර හා කාර්යාල උපකරණ (Machinery & Equipments) | | | | | | | | |
| 9153 | ඉඩම් (Lands) | | | | | | | | |
| 9154 | අස්පෘෂ වත්කම් (Intangible Assets) | | | | | | | | |
| 9155 | ජීවවිද්‍යාත්මක වත්කම් (Biological Assets) | | | | | | | | |
| 9160 | කෙරී ගෙන යන වැඩ (WIP of Buildings & Structures) | | | | | | | | |
| 9180 | කල්බදු වත්කම් (Lease Assets) | | | | | | | | |
| | | | | | | | | | |

* 7 හා 8 තීරු සඳහා වෙන වෙනම හේතු දක්වන්න
(* Give separate reasons for columns 7 and 8)